253.

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය" 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி மந்திரய", 32, ஸ்ரீமத் மார்கஸ் பர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi" Mandiraya, 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් /பிரதம செயலாளர்/Chief Secretary
දුරකථන/தொலைபேசி /Telephone 2698409
ෆැක්ස් /தொலைநகல் /Fax 2694667

පොදු/பொது/General
දුරකථන / தொலைபேசி / Telephone 2691666, 2682968, 2696027, 2682969, 2682870

මගේ අංකය / எனது இல / My No: 3/2/2/6/68
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2013/05/03

## මූල්‍ය චක්‍රලේඛ 07/2013

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

### වෙළඳපොල මිල සැදහුම් ක්‍රමයේදී පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය.

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි රජයේ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක කිරීම සඳහා උචිත පරිදි සකස් කිරීමට පත්කල කමිටුව විසින් සකස් කරන ලද ප්‍රසම්පාදන කටයුතු වලදී බස්නාහිර පළාත් සභාව තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත සඳහන් සංශෝධනයන්ට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එම සංශෝධන 2013.04 22 දින සිට ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වමි.

| අවලංගු කරන කොටස | ඒ වෙනුවට ආදේශ කරන කොටස. |
|---|---|
| 2008.12.27 මූල්‍ය චක්‍රලේඛ අංක 03/2008 හි උපලේඛන අංක 01"වෙළඳපොල මිල සැදහුම් ක්‍රමයේදී පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය" | මේ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 01. |

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.පරිගණක දත්ත ක්‍රියාකරු

# ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව : 2.14.1

## කොන්ත්‍රාත් පිරිනැමීම/ නිර්ණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරය.

වෙළඳපොල මිල සැදහුම් ක්‍රමයේදී (මාර්ගෝපදේශ 3.4) පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය.

01. සැපයුම් සහ සේවා කොන්ත්‍රාත්තු සඳහා මිල ගණන් පහත සඳහන් අය වෙතින් ඉල්ලුම් කළ හැකිය.
   i. දුරකථන නාමාවලියෙහි අඩංගු, ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ප්‍රකට වෙළෙඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම් එම සැපයුම්කරුවන් වෙතින්:
   ii. ප්‍රසම්පාදන අස්ථිත්වය සමඟ ලියාපදිංචි සැපයුම්කරුවන් : (අදාල වේ නම් )
02. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා මිල ගණන් ප්‍රජාපාදක සංවිධාන (ප්‍ර.පා.ස.) ඇතුලත්ව ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වෙතින් කැඳවිය හැකිය.

සෑම විටම ප්‍රසම්පාදන අස්ථිත්වයන් විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛණ භාවිතා කල යුතුය.

| අධිකාරය | ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු |
|---|---|---|
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වැඩ සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් පහකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවා කලින් දැනුම් දුන් දිනක වසන ලද සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කිරීම. | < රු :මිලියන 5 | < රු :මිලියන 5 |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව භාණ්ඩ හා සේවා සැපයුම් යෝග්‍ය ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් පහකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවා කලින් දැනුම් දුන් දිනක වසන ලද සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කිරීම. | < රු :මිලියන 2 | < රු :මිලියන 3 |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සහ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු වැඩ සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් පහකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවා කලින් දැනුම් දුන් දිනක වසන ලද සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කිරීම. | < රු :මිලියන 2 | < රු :මිලියන 5 |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සහ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා කලින් දැනුම් දුන් දිනක මුද්‍රා තැබූ මිල ගණන් පහකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කිරීම. | < රු :මිලියන 2 | < රු :මිලියන 3 |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සහ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව කලින් දැනුම් දුන් දිනක මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කරමින් භාණ්ඩ ප්‍රසම්පාදනය. | < රු :මිලියන 1 | < රු :මිලියන 1 |

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු වැඩ සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් පහකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවා කලින් දැනුම් දුන් දිනක වසන ලද සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කිරීම. | < රු :මිලියන 1 | < රු :මිලියන 1 |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු කලින් දැනුම් දුන් දිනක මුද්‍රා තැබූ මිල ගණන් පහකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කරමින් භාණ්ඩ සහ සේවා ප්‍රසම්පාදනය. | < රු 500,000 | < රු 500,000 |
| ප්‍රගනි/දෙප්‍ර/ව්‍යාඅ- වැඩ සඳහා වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කරමින් මුද්‍රා යෙදූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම මඟින් | < රු 500,000 | |
| ප්‍රගනි/දෙප්‍ර/ව්‍යාඅ- භාණ්ඩ හා සේවා සඳහා වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කරමින් මුද්‍රා යෙදූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම මඟින් | < රු 250,000 | |

අමාත්‍යාංශ ලේකම්/ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් මෙම අධිකාර සීමාව තුල අවශ්‍ය පරිදි ප්‍රසම්පාදන කටයුතු කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන (සුළු කමිටු) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (සුළු කමිටු) පත් කොට බලය පැවරීය හැකිය.

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"[illegible]" 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"[illegible]", 32, [illegible], கொழும்பு 07.
"Sravasthi" Mandiraya, 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல. / My No. 3/2/2/6/68

ඔබේ අංකය / உமது இல. / Your No.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone 2696409
ෆැක්ස් / பெக்ஸ் / Fax 2694667

පොදු / பொது / General
දුරකථන / தொலைபேசி / Telephone 2691665, 2682968, 2696027, 2682869, 2682870

දිනය / திகதி / Date 2013/05/03


<u>මුල්‍ය චක්‍රලේඛ 06/2013</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

<u>කොන්ත්‍රාත් ගිවිසුම ක්‍රියාත්මක කිරීම.</u>

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි රජයේ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක කිරීම සඳහා උචිත පරිදි සකස් කිරීමට පත්කල කමිටුව විසින් සකස් කරන ලද ප්‍රසම්පාදන කටයුතු වලදී බස්නාහිර පළාත් සභාව තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත සඳහන් සංශෝධනයන්ට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එම සංශෝධන 2013.04.22 දින සිට ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වමි.

| අවලංගු කරන කොටස | ඒ වෙනුවට ආදේශ කරන කොටස. |
|---|---|
| 2008.04.02 දිනැති මුල්‍ය චක්‍රලේඛ අංක 01/2008 හි ඇමුණුම අංක 08 | මෙ සමඟ අමුණා ඇති ඇමුණුම අංක 01. |

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.පරිගණක දත්ත ක්‍රියාකරු.

## කොන්ත්‍රාත් ගිවිසුම ක්‍රියාත්මක කිරීම.

ලංසුකරුවකු විසින් ඉදිරිපත් කරනු ලැබූ ලංසුවක් ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් එම ලංසුකරුට එසැනින්ම විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කල යුතුය. මෙයට පසුගාමීව පහත සඳහන් අවස්ථා සඳහා විධිමත් කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කල යුතුය.

(අ) ශ්‍රී ලංකා රු. 250,000 ක් (ශ්‍රී ලංකා රුපියල් දෙලක්ෂ පනස්දාහ) ඉක්මවන වැඩ සඳහා යම් කොන්ත්‍රාත්තුවක් : සහ

(ආ) ශ්‍රී ලංකා රු. 500,000 ක් (ශ්‍රී ලංකා රුපියල් පන්ලක්ෂය) ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා යම් කොන්ත්‍රාත්තුවක්.

විධිමත් කොන්ත්‍රාත්තුව පහත සඳහන් අධිකාරීන් විසින් අත්සන් තැබිය යුතුය.

| | මූල්‍ය සීමාව | අත්සන් කළ යුතු නිලධාරියා. |
|---|---|---|
| (i) | රු.දශ ලක්ෂ 100 ට වැඩි හෝ සමාන | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා/ ලේකම් |
| (ii) | රු.දශ ලක්ෂ 100 දක්වා | ගණන්දීමේ නිලධාරියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| (iii) | රු.දශ ලක්ෂ 50 දක්වා සහ ඊට අඩු | ගණන්දීමේ නිලධාරියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු. |

ඉහත නිර්දිෂ්ය මුදල් ප්‍රමාණයට අඩු ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වයට ස්වකීය අභිමතය පරිදි විධිමත් ගිවිසුමකට ඇතුලත් විය හැකිය.විධිමත් ලිඛිත ගිවිසුමක් අත්සන් තබා නොමැති නම් මිලයට ගැනීමේ ඇණවුමක් හෝ එවැනි වෙනත් යෝග්‍ය ලිඛිත ලේඛනයක් ප්‍රයෝජනයට ගත හැකිය.

248


# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"Sravasthi" Mandiraya, 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

My No: 3/2/2/6/68

Your No.:

ප්‍රධාන ලේකම් / Chief Secretary

Telephone 2886409

Fax 2894667

සාමාන්‍ය / General

Telephone 2891665, 2882866, 2896027, 2882869, 2862870

Date: 2013/05/03


මුල්‍ය චක්‍රලේඛ (i) 02/2013

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

**පළාත් ඉංජිනේරු කාර්යාංශය මඟින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.**

උක්ත මැයෙන් යුතුව 2013/01/30 දිනැතිව නිකුත් කරන ලද මුල්‍ය චක්‍රලේඛ අංක 02/2013 හා බැඳේ.

02. මුල්‍ය චක්‍රලේඛ අංක 02/2013හි 04 වන ඡේදය වන " ගිවිසුම් අත්සන් කිරීම "යන ඡේදය මෙයින් අවලංගු කරන අතර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.එම ආදේශ කිරීම 2013.04.22 දින සිට ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වමි.

**ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කිරීම.**

| | මුල්‍ය සීමාව (කොන්ත්‍රාත් මුදලේ වටිනාකම වැට් රහිතව) | අත්සන් කළ යුතු නිලධාරියා |
|---|---|---|
| (i) | රු.දශ ලක්ෂ 150 ට වැඩි | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා |
| (ii) | රු.දශ ලක්ෂ 150 හෝ ඊට අඩු | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| (iii) | රු.දශ ලක්ෂ 100 හෝ ඊට අඩු | ගොඩනැගිලි අධ්‍යක්ෂක |
| (iv) | රු.දශ ලක්ෂ 50 හෝ ඊට අඩු | ප්‍රාදේශීය ඉංජිනේරු |

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.පරිගණක දත්ත ක්‍රියාකරු.